# 37 වසරක කාලය තුළ ක්‍රියාබද්ධ පර්යේෂණ ඔස්සේ ග්‍රාමීය සංවර්ධනය සඳහා දායකත්වය

ගොවිජන පර්යේෂණ හා පුහුණු කටයුතු මාර්ගයෙන් ග්‍රාමීය සංවර්ධනය සඳහා සෘජු ලෙස මැදිහත්වීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයන් අතර ප්‍රමුඛ වුවකි. ඉකුත් වූ දශක තුනක කාලයේ දී ආයතනය විසින් ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා සෘජු මැදිහත්වීම් සිදු කළ අවස්ථා ගණනාවක්ම දැක්විය හැකිය. අක්කර සිය හා තෙල්එක ආදර්ශ ගම්මාන දියුණු කිරීමේ ව්‍යාපෘතිය, කැලේගම කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතිය, මොරගොල්ල කෘෂි සේවා ශක්තිමත් කිරීමේ වැඩසටහන, අඹම්පනේ කෘෂි සේවා ශක්තිමත් කිරීමේ වැඩසටහන, පුස්සැල්ලාගම කෘෂි සේවා ශක්තිමත් කිරීමේ වැඩසටහන සහ තිරසර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතිය යන ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් හා ව්‍යවසායකයන් සංවර්ධනය කිරීමේ වැඩසටහන ඒ අතර කැපී පෙනේ.

## 1.1 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කාර්ය බද්ධ පර්යේෂණ ඔස්සේ සිදු කරන ලද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රධාන කාර්යයක් වන්නේ සමාජ-ආර්ථික පර්යේෂණවල නියැලීම සහ ගොවිජන ක්ෂෙත්‍රයේ නිලධාරීන් හා ගොවීන් පුහුණු කිරීමයි. ගොවිජන ක්ෂෙත්‍රය පිළිබඳ සිදු කරන සමාජ-ආර්ථික පර්යේෂණයන් හි සොයා ගැනීම් ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත යොමු කොට, ඒවා ක්‍රියාත්මක කිරීමෙන් ග්‍රාමීය සංවර්ධනය සඳහා වක්‍රාකාරයෙන් දායක වෙයි. කෙසේ වුව ද, ආයතනය සිදු කරන ක්‍රියාබද්ධ පර්යේෂණ මඟින් ග්‍රාමීය සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් දැක්වීමේ හැකියාව ලැබී ඇත. ආයතනය විසින් ගෙවී ගිය 37 වසරක කාලය තුළ ක්‍රියාබද්ධ පර්යේෂණ රාශියක්ම සිදු කිරීමෙන් ග්‍රාමීය අංශයේ විවිධ ක්ෂෙත්‍ර ආවරණය වන පරිදි සංවර්ධන කාර්යයන් සිදු කිරීමට හැකියාව ලැබී තිබේ. ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් සමහරක් පිළිබඳ කෙටි සමාලෝචනයක් පහතින් දැක් වේ.

### 1.1.1 කැලේගම කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතිය

ජනසවිය භාරකාර අරමුදලේ මූල්‍ය අනුග්‍රහය මත ආයතනය විසින් කැලේගම කුඩා වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතිය 1992/93 වර්ෂවල දී ක්‍රියාත්මක කළේය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියළි කලාපීය වැව් ජනාවාසයක් වන කැලේගම, වැව් 05කින් සමන්විත කෘෂිකාර්මික ගම්මානයකි. වැව් පද්ධතිය වසර 40 කින් කිසිම ප්‍රතිසංස්කරණයක් සිදු කර නො තිබූ බැවින්, වී වගාව සඳහා වාරිමාර්ග පහසුකම් ලබා ගැනීමට ද නො හැකි තත්ත්වයකට පත්ව තිබුණි. මෙම තත්ත්වය මඟ හරවා වැව් පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමෙන් වී වගාවට අවශ්‍ය ජල පහසුකම් සපයා දී ගමේ සමාජ-ආර්ථික දියුණුවක් ඇති කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. ව්‍යාපෘතියේ දිගු කාලීන අරමුණු කිහිපයක් වූ අතර ඒවා පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

i. කෘෂිකාර්මික සහ ගේ දොර අවශ්‍යතා සඳහා ජලය සැපයීම දියුණු කිරීම.

ii. පෝෂිත ප්‍රදේශයේ ගස් ගොම්මන වැඩි දියුණු කිරීම හා පරිසර පද්ධතිය දියුණු කිරීම.

iii. ක්ෂෙත්‍ර භෝග සහ වෙනත් ආහාර භෝග වගාව සංවර්ධනය කිරීම.

iv. සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම.

v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතරතුර සමාජ සජීවිකරණයක් සිදු කිරීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද්දේ ජනතා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයයි. ඒ අනුව, සැලසුම් අවදියේ දී, ක්‍රියාත්මක අවදියේ දී, ඇගයුම් අවදියේ දී සහ ප්‍රතිලාභ ලබන අවදියේ දී පූර්ණ ජනතා සහභාගිත්වය ලබා ගනිමින් ක්‍රියාත්මක කළේය. මෙවැනි ව්‍යාපෘතියක දී ජනතා සහභාගිත්වය

ලැබුණා වූ ආකාරය පිළිබඳව පර්යේෂණ අවධානය යොමු විය. දරිද්‍රතාවයෙන් ඉහළ කෘෂිකර්මය හැර වෙනත් ජීවනෝපායයන් සීමිත, මෙවැනි වැව් ගම්මානවල ජනතා සහභාගිත්වය දිගු කාලයක් අඛණ්ඩව ලබා ගැනීමට යෑමේ දී ඔවුන්ට යම් කිසි ගෙවීමක් සිදු කිරීම මඟින් එය වඩාත් සාර්ථක කළ හැකි බව හෙළි විය. කැලේගම වැව් පද්ධතිය වැඩි දියුණු වීම හා එමඟින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සඳහා ආදායමක් ලබා ගැනීමට හැකි වීම, වී වගාව සඳහා ජලය සපයා ගැනීමේ ගැටළුව විසඳීමෙන් පහසුවෙන් ජලය සපයා ගත හැකිවීම. නෑම, රෙදි සේදීම වැනි වැවෙන් කර ගන්නා කාර්යයන් පහසුවීම, වැව් රක්ෂිතයේ වන වගාව සහ සමාජ සජීවීකරණය මෙම ව්‍යාපෘතියෙන් කැලේගම ජනතාවට ලැබුණු සෘජු ප්‍රතිලාභ ලෙස දැක්විය හැකිය.

### 1.1.2 **කෘෂි ව්‍යාප්ති සේවා විධිමත් කිරීමේ වැඩසටහන**

ආසියා-පැසිපික් කලාපීය රටවල ඒකාබද්ධ ග්‍රාම සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානය (CIRDAP) හා ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) යන ආයතනයන් හි සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව ද ඇතුළු ආසියා-පැසිපික් කලාපයේ රටවල් 7ක ක්‍රියාත්මක කරන ලද කෘෂි ව්‍යාප්ති සේවා විධිමත් කිරීමේ නියමු ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද්දේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයයි. කෘෂි සහායක සේවා වඩාත් විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා ගොවි ජනතාව මූලික කරගත් කෘෂි තාක්ෂණ සේවා ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණයක් පිළිබඳ අත්හදා බැලීමේ ආදර්ශනයක් ලෙස මෙම ව්‍යාපෘතිය 1995/1996 වර්ෂවල දී ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘතියේ විශේෂිත අරමුණු පහත දැක් වේ.

- සුළු ගොවීන් සඳහා කෘෂිකාර්මික සේවා සහ යෙදවුම් සැපයීම පහසු කිරීම හා වැඩි දියුණු කිරීම.
- ගොවිපොළ මට්ටමේ සමීප සම්බන්ධයක් පවත්වාගෙන යාම සඳහා කෘෂි තාක්ෂණ සහාය සේවා ආයතන සහ සේවාවන් විමධ්‍යගත කිරීමට සහාය දීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට ගොවීන්ට සහභාගිවීමට හැකියාව ලැබෙන නිසා සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සපුරාදීම.
- ක්ෂෙත්‍ර නියෝජිතයන්ගේ වැඩ කිරීමේ තත්ත්වය වැඩි දියුණු කිරීම.
- ව්‍යාප්ති/අධ්‍යාපන පුහුණු, කෘෂි ණය සැපයීම, අලෙවිය, පසු අස්වනු සැකසීම, ගබඩා කිරීම යන කටයුතු පුහුණු හා පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතාවය, පර්යේෂණ ක්ෂෙත්‍ර නියෝජිතයන්, ගොවි නියෝජිතයන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය අවස්ථා දෙකකින් සමන්විත ය. එනම්, ක්‍රියාකාරී කොටස සහ පර්යේෂණාත්මක කොටස වශයෙනි. ක්‍රියාකාරී කොටසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මකව ඉදිරියට ගමන් කරන අතර පර්යේෂණ කොටසින් කෙරෙන්නේ ක්‍රියාකාරී කොටස පිළිබඳ පර්යේෂණ ආශ්‍රිත ඉගෙන ගැනීමේ කාර්යයි.

මෙම ව්‍යාපෘති යෝජනාවෙන් අවධාරණය කර ඇති පරිදි මෙහි සංවර්ධන ප්‍රවේශය වූයේ කුඩා කණ්ඩායම් හා ඒවායේ නායකයින්. එම නායකයින්ගෙන් සමන්විත වූ ග්‍රාමීය සංවර්ධන සභාව සහ එහි සභාපති. කෘෂි තාක්ෂණ සේවා බෙදා හැරීමේ යාන්ත්‍රණය හා සම්බන්ධ වූ කෘෂිකර්ම සේවා තාක්ෂණික සහායක මධ්‍යස්ථානය යන ජනතාවගෙන්ම සමන්විත වූ ආයතන කිහිපයක් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමයි. මෙය ද ජනතා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය භාවිතා කරන ලද්දකි.

ජනතා සහභාගිත්ව ක්‍රියාබද්ධ පර්යේෂණ ඔස්සේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරගොල්ල ගම්මානයේ කෘෂි තාක්ෂණ සහාය සේවා මධ්‍යස්ථානයක් ඇරඹීම, පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයුම් මධ්‍යස්ථානයක් ඇරඹීම, කුඩා පරිමාණ චක්‍රීය ණය අරමුදලක් පිහිටුවීම මඟින් ණය සැපයීම, සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම, ඒකාබද්ධ පළිබෝධ පාලනය, යාය ආදර්ශනයක් පිහිටුවීම, කෘෂි තාක්ෂණික සේවා සැපයීම යටතේ භෝග වගා කිරීම, කළමනාකරණය රෝග හා පළිබෝධ පිළිබඳ දැනුම වැඩි කිරීම, කජු වගා කිරීම, පසු අස්වනු තාක්ෂණය, මිරිදිය

ධීවර කර්මාන්තය සංවර්ධනය, ජාතික පර්යේෂණායතන සමඟ ගොවීන් සම්බන්ධ කිරීම මාර්ගයෙන් එම ප්‍රථිලාභ ලබාදීම හා ගොවි ඒකාබද්ධ අලෙවි ක්‍රම පිළිබඳ අවබෝධය ලබාදීම යන කාර්යයන් රාශියක් ගොවි ජනතාව සඳහා ක්‍රියාත්මක විය.

### 1.1.3 ගොවි ජනතාව කේන්ද්‍ර කරගත් කෘෂි සම්පත් කළමනාකරණ (FARM) ව්‍යාපෘතිය

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මුලිකත්වයෙන් 1991/1992 වර්ෂයන් හි මිහිකත සමුළුවෙන් සම්මත යෝජනාවකට අනුව කෘෂි සම්පත් කළමනාකරණය හා තිරසාර සංවර්ධනය අරමුණු කර ගනිමින් ගොවි ජනතාව කේන්ද්‍ර කර ගත් කෘෂි සම්පත් කළමනාකරණ (FARM) වැඩසටහන ශ්‍රී ලංකා රජය විසින් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, ස්වභාවික සම්පත් කළමනාකරණ ආයතනය, බණ්ඩාරවෙල-බිඳුනුවැව කෘෂිකර්ම පර්යේෂණායතනය, මහඉලුප්පල්ලම කෘෂිකර්ම පර්යේෂණායතනය යන ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කළේය.

තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මානක්කුලම ග්‍රාම නිලධාරී වසමේ දී 1995/1996 යන වර්ෂයන් හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ජනතා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය මෙම ව්‍යාපෘතියේ දී සංවර්ධන ප්‍රවේශය ලෙස ව්‍යාපෘති යෝජනාවෙන්ම නිර්දේශ කර තිබුණි. මෙහි දී, ගොවි ජනතාව කේන්ද්‍ර කරගත් කෘෂි සම්පත් කළමනාකරණය අරමුණු කරගනිමින් සහභාගී වූ විවිධ ආයතන ක්ෂේත්‍රය තුළ ක්‍රියාකාරකම් රාශියක් සිදු කළේය. මෙම සියළුම ක්‍රියාකාරකම් සමාජයීය සහ භෞතික සංවර්ධනය සඳහා සෘජුවම හේතු විය.

ජනතා සහභාගිත්ව ක්‍රමවේදය භාවිතා කරමින් ජනතාව විසින් ම තම ගම්මානය පිළිබඳ ස්වයං විශ්ලේෂණ අභ්‍යාසයක නිරත වීමෙන් පසුව, කෘෂි සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කර ගැනීම සඳහා ජනතාව විසින්ම සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාවට නැංවුයේය. සහභාගි වූ එක් එක් ආයතන විසින් මෙම වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍යමය තාක්ෂණික සහයෝගය සැපයීය. ක්‍රියාත්මක වැඩසටහන් යටතේ මානක්කුලම වැව ප්‍රති-සංස්කරණය, ජල පෝෂක සංරක්ෂණය සඳහා පස් වැටි ඉදි කිරීම, එළු පාලනය, කිරි ගව පාලන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, ප්‍රදේශයට ආවේණික පැඟිරි වර්ගයක් වූ කුඩළු-දෙඩම් නැමති පැඟිරි වර්ග ගෙවතුවල වගා කිරීම සහ බද්ධ කිරීම මෙන්ම කෘෂි වන වගා ඖෂධ හා පළතුරු පැල තවාන් 04 ක් පිහිටුවීම, කාබනික පොහොර නිපදවීම, "කිවි ප්‍රභේදය" අන්නාසි වගාව ඇරඹීම, අඹ වගාව ආරම්භ කිරීම, බඳුන් ජල සම්පාදන ක්‍රමය හඳුන්වාදීම, මී මැසි පාලනය හඳුන්වා දීම කෘෂිකාර්මික මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා චක්‍රීය අරමුදලක් ආරම්භ කිරීම, භෝග වගා තාක්ෂණ උපදෙස් ලබාදීම යන කාර්යයන් සිදු කළේය. ගොවිකටයුතු පර්යේෂණායතනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් කරුවෙක් වූ අතර ආයතනය විසින් ඉටු කරන ලද්දේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වඩාත් සාර්ථකව ක්ෂේත්‍රය තුළ සිදු කිරීම සඳහා අවශ්‍ය සංවිධාන හා කාන්තා සංවිධාන ශක්තිමත් කිරීමයි. එයට අමතරව නායකත්ව පුහුණුව සහ ව්‍යවසායකත්ව හැකියා සංවර්ධන පුහුණුව ද ලබා දුන්නේය. ගොවීන්ගේ නිෂ්පාදන ගොවීන්ටම අලෙවි කර ගැනීමේ අලෙවි පහසුකමක් වශයෙන් ගොවි සංවිධානය සඳහා අනුරාධපුර කොළඹ මහා මාර්ගය ආසන්නයේ වෙළඳසැල් ඉදි කර දුන්නේය. කාෂි සැකසුම් කර්මාන්තය සහ වටිනාකම් වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික ද්‍රව්‍ය සකස් කිරීමේ යන්ත්‍රයක් ගොවි සංවිධානය වෙත ලබා දුන්නේය.

ගොවි ජනතාව කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලද මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් ඉගෙනීමක් (Learning from action) මෙහි පර්යේෂණ කොටසින් සිදු කරන ලදී.

### 1.1.4 ග්‍රාමීය කෘෂි ව්‍යවසායකයින් සහ නියෝජිතයින් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

වර්තමානයේ ශ්‍රී ලංකාවේ එක් කෘෂිකර්ම උපදේශකවරයෙකුට විශාල බල ප්‍රදේශයක කෘෂි ව්‍යාපෘති සේවා සැලසීමට සිදු වී තිබේ. මේ නිසා තම බල ප්‍රදේශයේ එක් එක් ගොවි මහතා තනි තනි ව හමු වී කෘෂි උපදෙස් ලබාදීමේ හැකියාවක් කෘෂිකර්ම උපදේශකවරයාට නැත. මෙම තත්ත්වය

යටතේ ගොවීන් පුරුදු වී ඇත්තේ තම බෝග වගාවන් සඳහා වැළඳෙන රෝග හා පළිබෝධ පිළිබඳ ගැටළු ප්‍රදේශයේ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිකරණ වෙළඳුන් හමු වී ප්‍රකාශ කර ඔවුන්ගේ උපදෙස් මත කෘෂි රසායනික ද්‍රව්‍ය මිල දී ගෙන වගාවට යෙදීමයි. වෙළඳුන් තම අත්දැකීම මත ගොවීන්ට උපදෙස් සහ මඟපෙන්වීම් සපයන අතර ඔවුන්ට විධිමත් කෘෂිකර්ම දැනුමක් නොමැත. මෙහි දී කෘෂි රසායනික වෙළඳුන් ඒ ඒ බල ප්‍රදේශවල නිල නොලත් කෘෂි උපදේශකවරු ලෙස ගොවීන්ට උපදෙස් ලබාදීමේ තත්ත්වයක් පෙන්නුම් කරයි. කිසියම් විටෙක මෙම උපදෙස් වැරදී ගියහොත් ගොවීන් විශාල පිරිසක් අපහසුතාවයට පත් වේ. එමෙන්ම, එය ජාතික නිෂ්පාදනයට ද හානි කර වේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ග්‍රාමීය මට්ටමේ කෘෂි ව්‍යාපාරිකයින් සඳහා කෘෂිකර්ම උපදේශකවරුන් මාර්ගයෙන් භෝග වගා පුහුණුව, රෝග හා පළිබෝධ පිළිබඳ දැනුම හා එවැනි අවස්ථාවල දී යෙදිය යුතු කෘෂි රසායනික ද්‍රව්‍ය, පොහොර භාවිතය, කෘෂි රසායනික ද්‍රව්‍ය සහ පොහොර ප්‍රවාහනය, ගබඩා කිරීම සහ අලෙවිය ඒ හා සම්බන්ධිත නීති-රීති හා ආචාර ධර්ම පිළිබඳ පුහුණුවක් ලබා දී විෂය දැනුමකින් සමන්විත පිරිසක් කෘෂි රසායනික ද්‍රව්‍ය හා පොහොර අලෙවි වෙළඳුන් ලෙස සේවයේ යෙදවීම, බීජ වී වගා කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම හා අලෙවිය පිළිබඳව ද විෂය දැනුමක් ලබා දී, කෘෂි ව්‍යවසායකයින් බවට පත් කිරීම මඟින් ගොවි ජනතාවට නිවැරදි කෘෂි සේවාවක් සැපයීම මෙහි අරමුණ විය.

මෙම ව්‍යාපෘතියට අනුග්‍රහය ලබා දුන්නේ මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (REAP) මඟිනි. මාතලේ දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද තරුණ කෘෂි ව්‍යවසායකයින් 30දෙනෙකු සඳහා මෙම පුහුණුව ලබා දුන්නේය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරු මාර්ගයෙන් පුහුණුව ලබාදෙමින් කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි කිරීමේ බලපත්‍රය ලබාදීමත්, කඳුරට බැංකුව මාර්ගයෙන් ණය ලබාදීමත්, වෙළඳසැල් සඳහා අවශ්‍ය රාක්ක සහ නාම පුවරු ව්‍යාපෘති වියදමින් සැපයීමත්, මෙම කෘෂි ව්‍යවසායකයන් පිළිබඳව අදාළ ප්‍රදේශවල ගොවීන් දැනුවත් කිරීමක්, සිදු කළේය.

### 1.1.4.1 ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙන් ලද අත්දැකීම්

මෙම ව්‍යාපෘතිය ආරම්භක අවධියේ සාර්ථකව ක්‍රියාත්මක විය. පසුව, ඇතැම් ව්‍යවසායකයින් වෙනත් ජීවන මාර්ගවලට යොමුවීමෙන් කිහිප දෙනෙකු කෘෂි ව්‍යවසායක කටයුතු නතර කළේය. මෙම ව්‍යාපෘතියේ දී මුහුණ දුන් ප්‍රධාන ගැටළුවක් වූයේ කෘෂිකාර්මික පුහුණුව ලබාදීමේ දී ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගැනීම සහ මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම, හෙට්ටිපොල වැනි දුර බැහැර ප්‍රදේශවලින් තෝරා ගත් කෘෂි ව්‍යවසායකයන් හට එකම ස්ථානයක දී නේවාසිකව පුහුණුව ලබාදීම ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය වුව ද, එය ඉතා අපහසු කාර්යයක් විය. එක් පසෙකින් විශාල දුරක් ගෙවා ඔවුන් පැමිණිය යුතු වූ බැවින් ප්‍රවාහන දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු විය. අනෙක් අතින් දින 3, 4 ක් නේවාසිකව පුහුණුවීම්වලට සහභාගීවීමට ඔවුන්ට අපහසු කාර්යයක් වූයේ ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු සඳහා එමඟින් බාධා පැමිණුන බැවිනි. කෘෂි ව්‍යාපාරික කාර්යයේ නියලුනේ නැති පුද්ගලයන් මෙම වෘත්තිය ආරම්භ කළ ද, පසු කාලයේ දී වෙනත්, වෙනත් රැකියාවලට මාරුවීම නිසා ද කිහිප දෙනෙකු මෙම ව්‍යාපෘතියෙන් ඉවත් විය. පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවියත්, බිත්තර වී අලෙවිය හා වී මිල දී ගැනීමත් යන කටයුතු සඳහා අතිවිශාල ප්‍රාග්ධනයක් වැය කිරීමට අවශ්‍යය. එම නිසා, බොහෝ දෙනෙකුට මෙම අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීමේ ගැටළුවට මුහුණ පෑමට සිදු විය. පොහොර සහනාධාරය ලබාදීම ඇරඹීමත් සමඟම පොහොර අලෙවිය සීඝ්‍රයෙන් පහළ බැසීම ද ව්‍යාපාරික කටයුතු අඩපන වීමට හේතුවක් විය. ක්ෂේත්‍රයේ බොහෝ ගොවීන් පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය මිලට ගන්නේ ණය පදනම මතය. මෙම තත්ත්වය මත කෘෂි ව්‍යවසායකයාට විශාල මුදලක් ආයෝජනය කර දිගු කාලයක් බලා සිටින්නට සිදු විය.

### 1.1.5 තිරසර සංවර්ධිත ගම්මාන වැඩසටහන

ශ්‍රී ලංකාවේ 75%කටත් අධික භූමි ප්‍රමාණයක් සමන්විත වී ඇත්තේ ගම්මානයන්ගෙනි. මෙම ගම්මානවල වෙසෙන ජනතාව සමාජ-ආර්ථික අංශයන්ගෙන් බොහෝ ගැටළු හා අඩුපාඩුකම් වලට

මුහුණ දී සිටී. මෙම ගැටළු හා අඩුපාඩු පිළිබඳව විමසා බලා ඒවාට එම ප්‍රදේශවල කෘෂි හා වෙනත් ආයතනවල සම්පත් සහ තාක්‍ෂණික ශක්තීන් යොදවා ආදර්ශ ගම්මාන ලෙස දියුණු කිරීම තිරසර ගම්මාන වැඩසටහන මඟින් සිදු විය. මේ යටතේ සිදු කිරීමට අපේක්‍ෂා කරනු ලැබූ විවිධ අත්හද බැලීම් ආශ්‍රයෙන් අනෙකුත් ගම්වලට ද අනුගමනය කිරීමට හැකි වන සේ ආදර්ශ ගම්මාන ලෙස දියුණු කිරීම අපේක්‍ෂාව විය. (චන්ද්‍රසිරි 2004)

මෙම තිරසර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතියේ දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු පහත සඳහන් පරිදි සඳහන් කළ හැකිය.

දිගු කාලීන අරමුණු

i. ස්ථිරසාර වූ නිෂ්පාදන ක්‍රියාවලියක් හා සංවිධාන ව්‍යුහයක් පදනම් කරගත් ආදර්ශන ගම්මාන බිහි කිරීම.

ii. ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම.

කෙටිකාලීන අරමුණ

i. ග්‍රාමීය ක්‍ෂෙත්‍රයේ ඵලදායීතාවය වර්ධනය කිරීම.

ii. ආහාර සුරක්‍ෂිතතාවය තහවුරු කිරීම.

iii. රැකියා සඳහා ඇති ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම.

iv. ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීම.

v. සංවර්ධනය සඳහා ජනතාවගේ සහභාගිත්වය උපරිම අන්දමින් යොද ගැනීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා ඒ ඒ ප්‍රදේශවල කෘෂිකාර්මික, වන සංරක්‍ෂණ, සත්ත්ව නිෂ්පාදන, තාක්‍ෂණික සේවා සහ වෘත්තීය පුහුණු වැනි තාක්‍ෂණික සේවාවන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විදුලිබල මණ්ඩලය, මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රාදේශීය සභාව/පළාත් සභාව යන ආයතනවල සම්පත් සහ තාක්‍ෂණික සේවා සම්බන්ධ කිරීම මඟින් ගමේ අඩුපාඩු සම්පූර්ණ කිරීම සිදු විය.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 9කින් තෝරාගත් ගම්මාන 10ක තිරසාර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ගම්මානවල කෘෂිකාර්මික භෝග වගා සංවර්ධනය, කෘෂි වන වගාව, සත්ත්ව පාලනය හා සුළු අපනයන භෝග වගා සංවර්ධන කටයුතු පසු අස්වනු තාක්‍ෂණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීම, කෘෂි ළිං තැනීම වැනි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ග්‍රාමීය ජන ජීවිතය නංවාලීම සඳහා සෘජුවම හේතු වන කාර්යයන් ඉටු කිරීමක් සිදු විය.

### 1.1.5.1 තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දකීම්

ව්‍යාපෘතිය පොදුවේ සලකා මෙමඟින් ලබා ගත හැකි වූ අත්දැකීම් පහත පරිදි සම්පිණ්ඩනය කිරීමට පුළුවන. එනම්, ගමේ ජනතාවගේම ගැටළු ජනතාව විසින්ම විශ්ලේෂණය කිරීම මත වූ, පූර්ණ ජනතා සහභාගිත්වය මත ගමේ මෙතෙක් නොවිසඳුනු ගැටළු ගමේ සම්පත් සහ පිටස්තර පහසුකම් යොදවා ඉටු කර ගැනීමට හැකිවන බව ප්‍රත්‍යක්‍ෂ විය. (චන්ද්‍රසිරි. 2004)

විශාල වශයෙන් මුදල් වියදම් කිරීමට සිදුවන ඇතැම් ග්‍රාමීය අවශ්‍යතා ජනතාවගේ ඉමහත් කැපවීම හා පිටස්තර සම්පත් කාර්යක්‍ෂම ලෙස යෙදීම මත ඉතා අවම වියදමකින් සපුරාගත හැකි බව මෙමඟින් ගම්‍ය විය.

ජනතාවට මුහුණපෑමට සිදු වී ඇති ප්‍රශ්න සම්භාරය තුළින් ඔවුන් පීඩාවට පත්ව සිටින නිසා මෙවැනි ව්‍යාපෘතිවල දී එම ප්‍රශ්න විසඳ ගත හැකි වෙතැයි යන බලාපොරොත්තුව මත විශාල ජනතාව සහයෝගයක් ලැබෙන බව පෙනී ගියේය. එම තත්ත්වය මත ජනතාව විසින්ම ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න ගැටළුවලට විසඳුම් ලබාදීමට ව්‍යාපෘතියට හැකියාව හා ශක්තිය තිබිය යුතුය. එසේ නොමැති වුවහොත් එමඟින් ජනතාවගේ බලාපොරොත්තු බිඳ වැටීමක් සිදු විය හැකිය.

දිගු කලක සිට ගම්මානවලට අතිශය විශාල ගැටළු උදකර ඇති වල් අලි උවදුර වැනි ගැටළු මෙවැනි ව්‍යාපෘතිවලින් විසඳ දෙන ලෙස ගම්බද ජනයා ඉල්ලා සිටි අතර එවැනි පොදුවේ සියළුම දෙනා මුහුණ දෙන උග්‍ර ගැටළු විසඳීමට උත්සාහ

කළ යුතුය. එලෙස නොවුනහොත් ව්‍යාපෘතිය විසින් කරනු ලබන වෙනත් සංවර්ධන කටයුතු වල ද වටිනාකම හීන වී යනු නොඅනුමානය.

මෙවැනි ව්‍යාපෘතිවලින් ග්‍රාමීය ප්‍රදේශවල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවම වියදමකින් හැකියාව ලැබෙන බව පැහැදිලි වන නිසා ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය වඩාත් හොඳ සංවර්ධන ප්‍රවේශයක් ලෙස ප්‍රත්‍යක්ෂ විය.

### 1.1.6 ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ආසියා-පැසිපික් රටවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානයේ සහයෝගය මත 1991-1996 කාලය තුළ ක්‍රියාත්මක කරන ලද මෙය ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියකි.

මහනුවර දිස්ත්‍රික්කයට අයත් පානබොක්ක, අක්කරසීය සහ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පහළ තඹවිට යන ගම්මාන තුනෙහි මෙම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉල්ලකය වුයේ ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නංවා ජිවන තත්ත්වය උසස් කිරීම මඟින් දුප්පත්කම අවම කිරීමයි. එහි දී, ඔවුන්ගේම සංවර්ධනය වෙනුවෙන් ජනතාවගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීම ද ප්‍රධාන ඉලක්කයක් විය.

ව්‍යාපෘතියේ විශේෂිත පරමාර්ථ පහත සඳහන් පරිදි දැක්වීමට පුළුවන.

i. ජනතාව මුහුණ දී සිටින පොදු ප්‍රශ්න සඳහා විසඳුම් ලබා ගැනීම පිණිස ප්‍රජා නියෝජිතයන් එකතු කිරීම හා සංවිධානාත්මක ක්‍රියාකාරකම්වලට යොමු කිරීම.

ii. ඒකාබද්ධ සංවර්ධන සහ ඉලක්ක කණ්ඩායම්වල අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිදි ගම තුළ පවත්නා සම්පත් කළමනාකරණය කර ගැනීමට ප්‍රජාව උනන්දු කරවීම.

iii. අඩු පොලී සහ පහසු ණය වැඩසටහන් ඔස්සේ ස්වයං රැකියා ජනනය කරමින් ආදායම් ඉහළ නැංවීම.

iv. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර පහසුකම් සපයන්නන් විසින් ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී අනුගමනය කරන ක්‍රමවල බලපෑම හා අවස්ථාවට වඩාත් ගැලපෙන උපාය මාර්ග මොනවාදැයි හඳුනා ගැනීම.

v. සංවර්ධනයේ පිටස්තර හවුල්කරුවන් ඉවත් වූ පසු ද සංවර්ධන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යාමේ සහභාගිත්ව තිරසර සංවර්ධනයක් සහතික කිරීම.

#### 1.1.6.1 සංවර්ධන ප්‍රවේශය

ජනතා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර ප්‍රජා සවංවිධාන ගොඩනැංවීම හා ශක්තිමත් කිරීම, ඉලක්ක කණ්ඩායම් නොඩනැඟීම, ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම වැනි කාර්යයන් ඊට සමගාමී ව සිදු කරමින් ප්‍රජා සහභාගීත්වය ශක්තිමත්ව පවත්වාගෙන යාමට මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියා කළේය.

#### 1.1.6.2 ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම්

ස්ව උත්සාහී සංවර්ධනයක් සඳහා ජනතාව පෙළ ගැස්වීම පිණිස ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම හා ජනතාවගේ වර්තමාන සිතුම්-පැතුම් වෙනස් කිරීම පිණිස ගෘහස්ථ සාකච්ජා, කණ්ඩායම් රැස්වීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්විය. පහසුකම් සපයන්නන් විසින් ජනතාවට ස්වශක්තියෙන් නැඟී සිටීමේ වැදගත්කම පිළිබඳව නිවෙස් කරා ගොස් කරුණු අවබෝධ කර දීම හා ඔවුන් ප්‍රජා සංවිධාන වශයෙන් සංවර්ධන කටයුතු සඳහා ධෛර්යමත් කිරීම සිදු කළේය.

#### 1.1.6.3 චක්‍රීය අරමුදල ඇරඹීම

ආසියා-පැසිපික් කලාපීය රටවල ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථාන විසින් ලබාදුන් අරමුදල් යොදවා ගනිමින් සහ ජනතාව විසින් ඔවුන්ගේම මුදල් ආයෝජනය කරමින් චක්‍රිය අරමුදලක් ස්ථාපිත කර අත්‍යාවශ්‍ය අවස්ථා සඳහා

ණය ලබා ගැනීම හා නිෂ්පාදන කටයුතු සඳහා ණය ලබාදීම සිදු කළේය.

### 1.1.6.4 ආදායම් උත්පාදන ව්‍යාපෘති ඇරඹීම

චක්‍රීය අරමුදල් සහ පුහුණුව ලබාදීමෙන් පසුව ජනතාව විසින් ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් ආරම්භ කළේය. මේ යටතේ එළු ගව පාලනය, සිල්ලර කඩ, භෝග වගාව ආදිය දැක්විය හැකිය.

### 1.1.6.5 ප්‍රජා සංවිධාන ගොඩනැංවීම

මෙම ව්‍යාපෘති ගම්මාන තුනෙන්ම ළමා සංවර්ධන සමිති සහ කාන්තා සංවර්ධන සමිති ආරම්භ කළේය. මේ යටතේ ළමා හා කාන්තා සංවර්ධනය සඳහා ජනතාව උනන්දු කරවීම සිදු විය.

### 1.1.7 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම්

චක්‍රීය අරමුදල මඟින් ලබාදුන් ණය මුදල් ආපසු ගෙවීමේ දුර්වලතාවය මත චක්‍රී අරමුදලේ තිරසාර බව පිරිහී යාම සිදු විය. එයට හේතුව චක්‍රීය අරමුදලින් ණය මුදල් ගෙන ආරම්භ කළ ආදායම් උත්පාදන ව්‍යාපෘති අසාර්ථක වීමයි. උදාහරණයක් ලෙස අක්කරසීය ගම්මානයේ ආරම්භ කළ ආදායම් උත්පාදන ව්‍යාපෘති 33න් 26ක් අතරමඟ දී නැවතී ඇත. මේ නිසා, සමුපකාර ප්‍රජා සංවිධාන ද පිරිහීමට පත් විය. එසේ වුව ද, පානබොක්ක ගම්මානයේ ආදායම් උත්පාදන ව්‍යාපෘති සාර්ථකවීමත්, චක්‍රීය අරමුදල ශක්තිමත්වීමත්, එම නිසා සමුපකාර ප්‍රජා සංවිධාන ශක්තිමත්ව පැවැත්වීමත් සිදුවිය. ජනතාවගේ ආයෝජන හැකියාවේ තත්ත්වය අලෙවි අපහසුතා සහ ව්‍යාපෘති සේවා ආදිය ද මෙම ආදායම් උත්පාදක ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථක බවට හේතු විය. ආරම්භ කරන ලද ඇතැම් ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල ස්වභාවය අනුව ද, ඒවායේ තිරසාරභාවය තීරණය වෙයි.

ව්‍යාපෘතිය සඳහා ජනතා සහභාගිත්වය උද්දීපනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේද සාර්ථක ප්‍රතිඵල පෙන්විය. උප කමිටු යටතේ ඇතිකල උප ඉලක්ක කණ්ඩායම්වලින් සමන්විත ප්‍රධාන සංවිධානය, ජනතාව ව්‍යාපෘතිය කෙරේ වඩාත් බැඳීමක් ඇති කිරීමට සමත් වූ යාන්ත්‍රණයක් ලෙස සාර්ථක වූ බව පැහැදිළි විය. එසේම, මෙම ව්‍යාපෘතියෙන් ජනතාවට ඉදිරිපත් කළ ස්ව උත්සාහයෙන් සංවර්ධනය ඇති කර ගැනීමේ දර්ශකයන් සඳහා ජනතාව දැක් වූ ප්‍රතිචාරය මත ද එහි සාර්ථක අසාර්ථක බව තීරණය විය. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ ඇතැම් ව්‍යාපෘතිවලින් ජනතාවට නොමිලේ ලබාදුන් ඇතැම් වරප්‍රසාද නිසා ද මෙම ව්‍යාපෘති දෙස ජනතාවගේ ආකල්ප යහපත් නොවීමට හේතු විය. ජනතාව ව්‍යාපෘතිවලින් ක්ෂණික ද්‍රව්‍යාත්මක ලැබීම් අපේක්ෂා කරන තත්ත්වයක් යටතේ මෙවැනි ව්‍යාපෘතිවලින් ලැබෙන ප්‍රතිඵල දිගු කාලීනව ලබා ගැනීමට සිදුවන නිසා ද මෙවැනි ව්‍යාපෘති පිළිබඳ යහපත් ආකල්පයකින් නොබැලීමට පුරුදු වී සිටිති. මෙවැනි අත්දැකීම් රාශියක් මෙම ව්‍යාපෘතිය යටතේ ලබා ගැනීමට හැකි විය.

මෙය උදාහරණ කිහිපයක් පමණකි. මෙවන් ක්‍රියාබද්ධ පර්යේෂණ රාශියකට දායකත්වය සපයමින් 37 වසරක් මුළුල්ලේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ඉමහත් දායකත්වයක් ලබාදුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අද (2009 පෙබරවාරි 21) එහි 37 වසරක අතීතය සමරන්නේ මහත් වූ අභිමානයෙනි. අනාගතය සඳහා ද මෙවන් දායකත්වයක් සැපයීමට සැදී පැහැදී සිටින මෙම ආයතනයේ කාර්යයන් ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ සුවිශේෂී සටහනක් තබනු ඇති බව නො අනුමානය. එමෙන්ම, ඒ සඳහා සැම දෙනාගේම අදහස් උදහස් රැගෙන සැකසූ මනා සැලසුමක් ද වෙයි. මේ එය ක්‍රියාවට නැඟීමයි.

**ආර්.එල්.එන්. ජයතිස්ස**
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය